**මාධ්‍ය ප්‍රවණතා**

# තොරතුරු තාක්ෂණය හොඳට නරකට

**තොරතුරු තාක්ෂණය තුළ වර්ධනය වී ඇති එක් ප්‍රබල බාධකයක් වෙයි. එය නම් අනාගතය නිවැරදිව තක්සේරු කිරීමට නොහැකි වීමයි. කිසියම් ක්ෂේත්‍රයක තව අවුරුදු දහයකින් කුමක් සිදුවේදැයි අද කිව නොහැකිය. තාක්ෂණයත් සමාජයත් ඉතා වේගයෙන් වෙනස්වීම එයට හේතුවයි.**

සී. පී. කුරුප්පු

තොරතුරු තාක්ෂණ විප්ලවය අද මුළු ලොවම වෙළා ගෙන අවසන්ය. එහෙත් තොරතුරු තාක්ෂණයෙන් මානව වර්ගයාට සැලසී ඇති යහපත මෙන්ම එය තුළ සැඟවී ඇති විපත් ගැනද විවිධ රටවල උගත්තු අද පවා දිගින් දිගට සාකච්ඡා කරති.

තොරතුරු තාක්ෂණය අද ලොව ඇති වටිනාම සම්පත යැයි මෙම උගතුන් ගෙන් එක් කොටසක් පවසන අතර තොරතුරු තාක්ෂණය අපගේ ආර්ථිකය දෙදරවා සමාජය ඉරා දමා පරිසරය බිඳ හෙළන බලවේගයක් බව තවත් කොටසක් පවසයි.

මේ අන්ත දෙකටම, වැඩියෙන් ඇදී යෑම කාලය නාස්ති කිරීමක් බවත් අන්ත දෙකේම ඇති එලදායී අදහස් බාර ගෙන ක්‍රියා කිරීම වඩා ප්‍රයෝජනවත් බවත් මධ්‍යස්ථ මතධාරී උගතුන්ගේ අදහස වෙයි.

ශාරීරික ශ්‍රමය, පාෂාණ, භූමිය, ඛනිජ, ලෝක බලශක්තිය යන සම්පත් මගින් ඉටු කළ මෙහෙයට වැඩි මෙහෙයක් තොරතුරු තාක්ෂණය මගින් අනාගතයේදී ඉටු කරනු ඇතැයි වර්ජිනියා රාජ්‍ය සරසවියේ ආචාර්ය හාලන්ඩ් ක්ලීව්ලන්ඩ් පවසයි.

ඇමරිකාවේ කැලිපෝනියාවේ දාර්ශනිකයකු වන ස්ට්‍රවර්ට් බ්‍රැන්ඩ් තොරතුරු තාක්ෂණය පිළිබඳ සිය මතය මෙසේ ඉදිරිපත් කරයි.

"තොරතුරු තාක්ෂණ ලෝලීන් මෙන්ම තොරතුරු තාක්ෂණයට බිය වන්නෝද අප අතර සිටිති. තාක්ෂණ ලෝලියකු වීමෙන් නව තාක්ෂණ ක්‍රමෝපායන් පිළිබඳ වැඩිදුර පරීක්ෂණ පවත්වා ජනතාවට වැඩි සේවයක් ලබා දීමට අවස්ථාව සලසා ගත හැකිය. තාක්ෂණයට බිය වන්නකු වීමෙන් තාක්ෂණය ගැන සැක උපදවා එහි ඇති අහිතකර අංශ හඳුනා ගත හැකිය. මේ අනුව පූර්ණ තාක්ෂණ ලෝලියකු හෝ බිය ගුල්ලකුවීමෙන් පලක් නැත."

තොරතුරු තාක්ෂණය නිසා සමාජය තුළ ඇතිවී තිබෙන සීඝ්‍ර වෙනසත් අනාගත සංකීර්ණ තත්ත්වයත් හඳුනා ගැනීමට සහ ඒවා පාලනය කිරීමට අප මෙතෙක් යොදා ගනු ලැබූ සංකල්ප ප්‍රමාණවත් නොවනු ඇතැයි ක්ලීව්ලන්ඩ් පවසයි.

මෙම තාක්ෂණය නිසා අපගේ ජීවන රටාව අධික වේගයකට හසුවී ඇත. මෙම වෙනස් වන වේගයට අපගේ සමාජ සැකැස්ම සහ සංස්කෘතිය මෙතෙක් සාර්ථක ලෙස මුහුණ දී තිබේ.

එහෙත් ඒවා දූන් සැහෙන දෙදරීමකට හසුවී ඇති බව පෙන්නුම් කෙරෙයි. මෙයට පූර්ණ විසඳුමක් ඇතැයි මම නොසිතමි.

එබැවින් කළ හැක්කේ අයහපත් ප්‍රතිඵල අවම කර ගැනීම පමණයැයි බ්‍රැන්ඩ් සඳහන් කරයි.

ලොව අද ඇති වටිනාම සම්පත තොරතුරුය. භාවිතයට ගැනීමත් සමඟ තොරතුරුවල ව්‍යාප්තිය ඇති වෙයි. තොරතුරු තාක්ෂණය උසස් මට්ටමට පත්වෙද්දී එයට අඩු බලශක්තියකුත් අඩු අමුද්‍රව්‍ය ප්‍රමාණයකුත් අවශ්‍ය වෙතැයි ක්ලීව්ලන්ඩ් කියයි.

ඔහු තම අදහස වැඩිදුරටත් මෙසේ විස්තර කරයි.

"භූමිය, ශ්‍රමය සහ ධනය යන සම්පත්වලට හිමිව තිබූ ස්ථානය තොරතුරුවලට ලෙහෙසියෙන් අත්පත් කර ගත හැකිය. තොරතුරු එක් තැනක සිට තවත් තැනකට ලෙහෙසියෙන් යැවිය හැකිය. තොරතුරු කාන්දු වෙයි. තොරතුරු බෙදා හදා ගන්නවා මිස හුවමාරු කර ගන්නේ නැත."

තොරතුරු තාක්ෂණය තුළ වර්ධනය වී ඇති එක් ප්‍රබල බාධකයක් වෙයි. එය නම් අනාගතය නිවැරදිව තක්සේරු කිරීමට නොහැකි වීමයි. කිසියම් ක්ෂේත්‍රයක තව අවුරුදු දහයකින් කුමක් සිදුවේදැයි අද කිව නොහැකිය. තාක්ෂණයත් සමාජයත් ඉතා වේගයෙන් වෙනස්වීම එයට හේතුවයි.

තොරතුරු තාක්ෂණය නිසා අපට තිබිය යුතු පෞද්ගලික රහස්‍යභාවය අප කෙරෙන් ඈත් වෙගෙන යයි. එහෙත් ඒ නිසා මතුවන හොඳ පැත්තක් ද තිබේ. එනම් හැම දෙයක් ගැනම නොසඟවා ඇත්ත හෙළි කිරීමට අවස්ථාව ලැබීමයි.

හොර මැරකමක් හෝ වංචාවක් කර කෙනෙකුට දැන් ලෙහෙසියෙන් සැඟවී සිටිය නොහැකිය.

තොරතුරු තාක්ෂණය නිසා ආර්ථික අංශයට සැලැසී ඇති වාසි මෙතෙකැයි ගිණිය නොහැකිය. මේ අතර නීරය උපයෝගී කරගෙන කෙරෙන අපරාධද ඉහළ ගොස් ඇත.

අඩුපාඩු සහිතව අනාගත දින දර්ශනය ගණනය කිරීම නිසා ඇතිවී තිබෙන "මිලියනිම් බග්" යනුවෙන් හැඳින්වෙන ක්‍රි: ව: 2000 පසුව දින වකවානු ගණන් කිරීමට අපහසුවීම තොරතුරු තාක්ෂණය තුළින්ම මතුවී ඇති බරපතල අර්බුදයකි.

සාමාන්‍ය ජනතාවට වැඩි බලතල ලබා දිය යුතු යැයි කෙරෙන ඉල්ලීම පසුගිය කාලය තුළ නිතර අසන්නට ලැබිණි. ඒ ඉල්ලීම් ඉදිරිපත් කරන්නට සිහිනයකින්වත් සිතා ගත නොහැකි ආකාරයේ පහසුකම් සහ අවස්ථා නූතන තොරතුරු තාක්ෂණයේ පිහිටෙන් සාමාන්‍ය ජනතාවට අද ලැබී ඇත. ගතානුගතික ක්‍රමෝපායන් පරයමින් තමන්ට ඕනෑ දෙයක් නිර්මාණය කළ හැකි නව තාක්ෂණික මෙවලම් තරුණ කොටස් අතට අද පත්වී තිබේ.

වැඩිපුර මිල මුදල් අතේ නොමැති තරුණ කොටස් කොම්පියුටර් හරහා නව තොරතුරු තාක්ෂණය රැගෙන යමින් හාස්කම් කර ඇත. අන්තර්ජාලය එවැනි එක් හාස්කමකි.

අධ්‍යාපනික වෛද්‍ය කර්මාන්ත කෘෂිකර්ම සහ ආර්ථික ක්ෂේත්‍රවල පමණක් අන්තර්ජාලය සිදු කර ඇති විප්ලවය අසමසමය.

නව තොරතුරු තාක්ෂණයේ අහිතූ විපාක දකින විද්‍යාඥයන් අතර නිව්යෝර්ක් නුවර ආචාර්ය මයිකල් මේරියන්ද වෙයි.

නව තොරතුරු තාක්ෂණයේ අහිතූ විපාක ලැයිස්තුවක් ඔහු සකස් කර තිබේ.

එහි අහිතූ විපාක දහයක් ඇත. එහි මුලින්ම සඳහන් කර ඇත්තේ පමණට වැඩි තොරතුරු අපේ හිසට දරා ගත නොහැකි බවයි.

අනාගතය ගැන පුළුල් ලෙස සහ ගැඹුරින් කරන සිතා බැලීම්වල තත්ත්වයේ පහත වැටීමක් ඇති බව පෙනී යන බැවින් නව තොරතුරු තාක්ෂණය අනාගතයට නුසුදුසු යැයි මේරියන් කියයි.

නීතිය සහ සාමය සාර්ථක ලෙස පවත්වා ගෙන යෑම කෙරෙහි නව තොරතුරු තාක්ෂණය අහිතකර ලෙස බලපා ඇත.

රටක ජාතික ආරක්ෂාවටද එය අහිතකරය.

නව මෘදුකාංග තාක්ෂණය නවදුරටත් ව්‍යාප්ත වීමෙත් පසුව නව තොරතුරු තාක්ෂණය විසින් රැකියා ක්ෂේත්‍රය ආක්‍රමණය කරනු ඇත.

පරිසරය කෙරෙහි නව තොරතුරු තාක්ෂණය අහිතකර බලපෑම් ඇති කරයි.

සමාජය වඩාත් සංකීර්ණවීමත් සමඟ දේශපාලනය පිළිබඳ ජනතාව තුළ වූ උනන්දුව හීනවී යෑමත් නව විද්‍යුත් උපකරණ පිළිබඳ උනන්දුව වර්ධනය වීමත් සිදුවෙයි. මෙය ප්‍රජාතන්ත්‍රවාදයට අහිතකරය.

අප සතුව තිබිය යුතු පෞද්ගලික රහස්‍යභාවය ගිලිහී යයි.

නව තොරතුරු තාක්ෂණය නිසා ජීවත්වීම අධික වේගයකින් කර ගෙන යෑමට සිදුවෙයි. මෙය යහපත් දිවි පෙවතක් පවත්වාගෙන යෑමට අහිතකරය.

නව තොරතුරු තාක්ෂණය ජන කොටස් සහ ජාතීන් අතර පරතරය වැඩි කරයි. මෙය ජන කොටස් සහ ජාතීන් අතර සමානාත්මතාව ඇති කිරීමට බාධාවකි.

නව තොරතුරු තාක්ෂණයෙන් මානව වර්ගයාට සැළසෙන වාසි, අවාසිවලට වැඩිය. එහෙත් තමා දැක්වූ අවාසිදායක සාධක වාසිදායක සාධකවලින් යටපත්වී යෑමට ඉඩ දිය යුතු නැතැයි ආචාර්ය මේරියන් පවසයි. ❏